# ආයතන කාර්ය පටිපාටිය සම්බන්ධ පුහුණු වැඩසටහන

## 2025-09-23

*කේ.චන්දිමා නිරෝෂිණී*
*ශ්‍රී ලංකා පරිපාලන සේවය III*
*නාගරික කොමසාරිස්,*
*පොළොන්නරුව මහා නගර සභාව.*

# අපේ රටේ මූලික නීතිය ; ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව

- රජයේ සේවය සම්බන්ධයෙන් සියලු විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IX පරිච්ඡේදයේ සඳහන්ය.

## *මීට අමතරව,*

III පරිච්ඡේදය - මූලික අයිතිවාසිකම්

XVII පරිච්ඡේදය - රාජ්‍ය මූල්‍ය

IV පරිච්ඡේදය - රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම්.

VII අ පරිච්ඡේදය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

XVII අ පරිච්ඡේදය – පළාත් සභා පිහිටුවීම ( 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය)

XIX පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුස්මන්වරයා)

# ***රාජ්‍ය සේවා කොමිෂන් සභාව.***

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ IX වන පරිච්ඡේදයේ 54 වන ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපනය කර ඇත.

## ***ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 55 (1) –***

රාජ්‍ය සේවය සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ බලය අමාත්‍ය මණ්ඩලය සතුය.

## 55 (2)

සියලු දෙපාර්තමේන්තු ප්‍රධානින් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම.ඔවුන් විෂයෙහි විනය පාලනය හා ඔවුන් සේවයෙන් පහ කිරීම. අමාත්‍ය මණ්ඩලය වෙත පැවරේ.

## 55(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව රජයේ නිලධරයන්;

- පත් කිරිම.
- උසස් කිරීම
- මාරු කිරීම
- විනය පාලනය
- සේවයෙන් පහ කිරිම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරේ.

# දීප ව්‍යාප්ත සේවා

1. ශ්‍රී ලංකා පරිපාලන සේවය
2. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
3. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
4. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය
5. ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය
6. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය
7. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය
8. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය
9. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය
10. ශ්‍රී ලංකා වෛද්‍ය සේවය
11. ශ්‍රී ලංකා දේශිය වෛද්‍ය සේවය
12. ශ්‍රී ලංකා මිනුම් සේවය

# ඒකාබද්ධ සේවා

1. රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය
2. සංවර්ධන නිලධාරි
3. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය.
4. රාජ්‍ය භාෂා පරිවර්තක සේවය
5. ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවය
6. රියදුරු සේවය
7. කාර්යාල සේවක සේවය

# රජයේ සේවයේ සේවක වර්ගීකරණය

- ජ්‍යෙශ්ඨ මට්ටම
- තෘතීය මට්ටම
- ද්විතීක මට්ටම
- ප්‍රාථමික මට්ටම

## *“රාජයේ නිලධාරියා”*

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XXII වන පරිච්ඡේදය (අර්ථ නිරූපණය)

රජයේ නිලධාරියා යන්නෙන් අධිකරණ නිලධාරියෙකු හැර ජනරජය යටතේ වැටුප් ලබන ධූරයක් දරණ තැනැත්තෙක් ලෙස අදහස් වේ.

**එහෙත් ඊට පහත සඳහන් අය ඇතුළත් නොවේ.**

1. ජනාධිපතිවරයා
2. අග්‍රාමාත්‍යවරයා

3. කථානායකවරයා
4. අමාත්‍යවරයයෙක්
5. නියෝජ්‍ය අමාත්‍යවරයෙක්
6. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්
7. පාර්ලිමේන්තු මහ ලේකම් වරයා
8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක්
9. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සමාජිකයෙක්
10. ස්වාධීන කොමිෂන් සභාවක සාමාජිකයෙක්
11. පාර්ලිමේන්තු මහා ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්.

12. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජියෙක්.
13. රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්
14. විගණනාධිපතිවරයා
15. ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපතිවරයා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **41 ආ** ව්‍යවස්ථාවේ සඳහන් කොමිෂන් සභාවන්.

1. මැතිවරණ කොමිෂන් සභාව
2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
3. ජාතික පොලිස් කොමිෂන් සභාව
4. විගණන සේවා කොමිෂන් සභාව
5. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
6. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණය කිරීමේ කොමිෂන් සභාව
7. මුදල් කොමිෂන් සභාව
8. සීමා නීර්ණය කොමිෂන් සභාව
9. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

# රජයේ නිලධාරියා

- අධිකරණ නිලධාරියකු හැර ජනරජය යටතේ වැටුප් ලබන ඕනෑම අයෙක්.

# එහෙත් ඊට පහත සදහන් අය ඇතුලත් නොවේ.

- ජනාධිපති
- කථානායක
- ඇමතිවරයෙක්
- නියෝජ්‍ය ඇමතිවරයෙක්
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්
- පාර්ලිමේන්තු මහ ලේකම්.........15 ක්

# රජයේ නිලධාරියකුට අදාල මූලික නීති

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
2. ආයතන සංග්‍රහය
   - I කොටස
   - II කොටස
3. මුදල් රෙගුලාසි
4. ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය
5. රාජ්‍ය පාරිපාලන චක්‍රලේඛ
6. භාණ්ඩාගාර චක්‍රලේඛ

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

- IX පරිච්ඡේද රාජ්‍ය සේවය.
- XVII පරිච්ඡේද රාජ්‍ය මූල්‍ය.

# ආයතන සංග්‍රහය

## ➢I කොටස

- පරිච්ඡේද 29
- මුල් පරිච්ඡේද 5 වෙනුවට

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටි රීති.

- 2009.04.02 සිට ක්‍රියාත්මක
- 2023.01.01 සිට ක්‍රියාත්මක

# රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු බලතල.

I. පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, විනය පාලනය, සේවයෙන් පහ කිරීම.

II. රාජ්‍ය සේවය සම්බන්ධයෙන් රීති රෙගුලාසි කාර්ය පටිපාටි සෑදීමේ, සංශෝධනය කිරීමේ හා අවලංගු කිරීමේ බලය.

III. කාර්ය පටිපාටි සම්බන්ධයෙන් ගැටලු මතු වුවහොත් අවසන් තීරණය ගැනීමේ බලය.

IV. උද්ගතවන සුවිශේෂි තත්වයන් යටතේ කාර්ය පටිපාටි වලට වෙනස්ව ක්‍රියා කිරීමේ බලය.

V. රජයේ නිලධරයන්ගේ අභියාචනා බලධරය ලෙස ක්‍රියා කිරීම.

VI. තමන් වෙත පැවරී ඇති බලය අභිනියෝජනය කිරීමේ බලය.

## II කොටස

- XLVII – සාමාන්‍ය හැසිරීම හා විනය
- XLVIII – විනය කාර්ය පටිපාටිය පිළිබඳ රීති

# ආයතන සංග්‍රහය XLVII පරිච්ඡේදය

1.රජයට පූර්ණ පක්ෂපාතීත්වය දැක්විය යුතුය.

2.පවරනු ලබන ඕනෑම රාජකාරියක්
කාර්යක්ෂමවද අනලස්වද
ඉටු කළ යුතුය.

3. අදාල රාජකාරීමය උපදෙස් තේරුම්ගෙන
පිළපැදිය යුතුය.

4. සිය තනතුරේ සහ සේවයේ හොඳ නම රැකිය
යුතුය.

6. උසස් කිරීම් මාරු කිරීම් සම්බන්ධයෙන් බලපෑම් නොකළ යුතුය.

7. මහජනයාට අචාරශීලි විය යුතුය.

8. භාෂා විලාසය සංවර විය යුතුය.

9. පෞද්ගලික කටයුතු සඳහා රජයේ සේවකයන් හෝ රජයේ දේපළ යොදා නොගත යුතුය

## ❖ මත් පැන් හා විෂ මත්ද්‍රව්‍ය භාවිතය

- ➢ නිලධරයකු රාජකාරියෙහි නිරතව සිටිය දී හෝ
- ➢ රාජකාරියෙන් වියුක්තව සිටිය දී හෝ
  - ➢ තමා සේවය කරන කාර්යාල පරිශ්‍රය තුළ හෝ
  - ➢ වෙනත් රජයේ ආයතනයක පරිශ්‍රයක් තුළ
  - ➢ බීමත්ව සිටීම හෝ එවැනි ස්ථානයක දී නිලධරයකු වෙතින් මත්පැන් ගඳ වහනට වෙමින් පැවතීම හෝ විෂ මත්ද්‍රව්‍ය භාවිතා

- බීමත්ව සිටීම හෝ
- මත්පැන් ගඳ වහනය වෙමින් පැවතීම හෝ
- පිළිබඳව කරනු ලබන විධිමත් විනය පරීක්ෂණයකදී එම වරද සිදුකර ඇති බවට තහවුරු කිරීමට
- රජයේ වෛද්‍ය නිලධරයකුගේ හෝ
- මාණ්ඩලික මට්ටමේ නිලධරයන් දෙදෙනෙකුගේ
- සාක්ෂි වුවද ප්‍රමාණවත් වන අතර එම විධිමත් විනය පරීක්ෂණයක් මඟින් ඔහු වරදකරු බවට

- එම නිලධරයා සේවයෙන් පහ කිරීමට හෝ වෙනත් බරපතල දඬුවමක් පැනවීමට හෝ විනය බලධරයාට ලබය ඇත්තේය.
- දෙවන වරට ද වරදකරුවකු බවට පත්වන නිලධරයකු අනිවාර්යෙන්ම සේවයෙන් පහකළ යුතු වන්නේය.
- විෂ මත්ද්‍රව්‍ය පාවිච්චි කර ඇති බව රජයේ වෛද්‍ය නිලධරයකුගේ හෝ
- අධිකරණ වෛද්‍යවරයකුගේ වාර්තාවකින් තහවුරු වුවහොත් විධිමත් විනය පරීක්ෂණයක්

# XLVIII විනය ක්‍රියා පටිපාටිය

I. මූලික විමර්ශනය

II. චෝදනා පත්‍රය

III. නිදහසට කරුණු ඉදිරිපත් කිරීම

IV. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම

V. විනය නියෝගය

VI. අභියාචනා ක්‍රියාවලිය

# පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය

## AAT – Administration Appeal Tribunal

- ❖ **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 වන ව්‍යවස්ථාව අනුව -**

- ✓ 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරි පනත මඟින් .
- ✓ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරයි.

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

II. ජාතික පොලිස් කොමිෂන් සභාව.

III. විගණන සේවා කොමිෂන් සභාව

යන කොමිෂන් සභා මඟින් ගනු ලබන තීරණ සම්බන්ධයෙන් අභියාචනා AAT වෙත ඉදිරිපත් කළ හැකිය.

# රාජ්‍ය නිලධරයන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධ පළමු වන උප ලේඛනයෙහි වරදවල්.

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවනත නොවීම.

2. ජනරජය අපකීර්තියට පත් කිරීම/ එසේ කිරීමට ඉඩ හැරීම.

3. රාජ්‍ය විරෝධි/ ත්‍රස්තවාදි/සාපරාධි වැරදි

4. රාජකාරී වේලාව තුලදි/කාර්යල පරිශ්‍රයක් තුලදී මත්පැන්/ විෂ මත්ද්‍රව්‍ය භාවිතය/ ළග තබා ගැනීම.

6. රජයේ සම්පත් සාවද්‍ය/අයථා ලෙස පරිහරණය
7. නොසැලකිල්ලෙන් හෝ අනවධානයෙන් හෝ හිතාමතා රජයේ අයිතිවාසිකම් වලට පටහැනි වන අයුරින් ක්‍රියා කිරීම හෝ එසේ කිරීමට ඉඩ හැරීම.
8. රාජ්‍ය සේවය අපකීර්තියට පත් වන අයුරින් කටයුතු කිරීම.
9. රජයට/රාජ්‍ය සේවයට/ආයතනයකට හානිකරවිය [illegible] තොරතුරු අනාවරණය, පිටපත්

10. කූට ලේඛන සැකසීම, වෙනස් කිරීම,විකෘති කිරීම.

11. රජයේ නිලධාරියකුට පීඩා කිරීම.

12. ජේෂ්ඨ නිලධාරියකු නීත්‍යානුකූල නියෝග නොපිලිපැදීම.

13. නීතිරීති උල්ලංඝනය කිරීම.

14. ඉහත වැරදි කිරීමට අනුබල දීම, සහය වීම, ඉඩකඩ සලසා දීම.

# දෙවන උප ලේඛනයේ වැරදි.

පළමු උප ලේඛනයට නොවැටෙන නමුත් නිලධාරියකුගේ -

- අකාර්යක්ෂමතාව
- අදක්ෂතාවය
- අනවධානය
- අවබෝධය නොමැතිකම.
- අනිසි හැසිරීම
- නොසැලකිල්ල
- අවිනය

# රජයේ නිලධාරීන්ගේ නිවාඩු

- XII නිවාඩු
- XV අධ්‍යයන,අධ්‍යාපන හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යෑම.
- XVI නිවාඩු ගමන්
- XXIII ඇතැම් වර්ග වල ලෙඩ රෝග වලින් පෙළෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි
- XXV වෘත්තීය සංගම් වල සාමාජිකයන්ට අනුග්‍රහ
- XXXII දේශපාලන අයිතිවාසිකම් බුක්ති විදීම

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93, 22/93 (iii) 22/93 (vi)**

# සුභ අනාගතයක්!